සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
புத்த சாசனம், சமய மற்றும் கலாச்சார அலுவல்கள், தேசிய ஒருமைப்பாடு,சமூக பாதுகாப்பு மற்றும் ஊடகத்துறை அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs , National Integration , Social Security and Mass Media

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/08/PM/04/E.Power | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2024.10.15 |

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මඟින්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**"අස්වැසුම" ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන පිළිබඳව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වීම.**

"අස්වැසුම" සමාජ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභී පවුල් 300,000 පූර්ණ සවිබලගැන්වීම සඳහා වැඩසටහනක් සකස් කර ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ සිට ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දැනුවත් කිරීම හා උපදෙස් ලබා දීම දැනටමත් සිදු කර ඇත. ඒ අනුව, පළමු පියවරේදී සවිබලගැන්විය යුතු පවුල් හඳුනා ගැනීම මේ වන විට අවසන් කර ඇති අතර, එසේ හඳුනාගත් පවුල්වලට අදාල පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇත.

02. දෙවන පියවර යටතේ, හඳුනාගත් එක් එක් ප්‍රතිලාභී පවුල් සවිබලගැන්විය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම, දැනුවත් කිරීම, පුහුණුව ලබා දී, ජීවනෝපාය, මානසික හා සාමාජීය සංවර්ධනය ඇති කිරීම, පහසුකම් සැලසීම හා සංවිධාන කටයුතු සිදු කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම පිළිබඳව සමෘද්ධි කළමණාකරුවන් හා ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

03. ඒ සඳහා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති කළමණාකරුවන්, දිස්ත්‍රික් ජීවනෝපාය සංවර්ධන විෂය භාර කළමණාකරුවන් හට, පුහුණුව ලබා දී ඔවුන් පුහුණුලාභීන් පුහුණු කිරීමේ පුහුණුකරුවන් (TOT) ලෙස සූදානම් කර ඇත. මෙම නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වෙන වැඩමුළු සඳහා සම්පත් දායකයන් ලෙස යොදාගත යුතුය.

04. ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වන ලෙසත්, ඒ සඳහා පහත නිලධාරීන් සම්බන්ධ කර ගන්නා ලෙසත් දන්වමි.

- මූලස්ථාන සමෘද්ධි කළමණාකරු
- බැංකු සමිති කළමණාකරු
- බැංකු කළමණාකරුවන්
- ග්‍රාම නිලධාරී වසම්වල සේවයේ නියුතු සියලුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්

05. පහත දැක්වෙන විෂයන් ඇතුළත් කර පුහුණු සැලැස්ම සකස් කර ගත යුතුය.

- සවිබලගැන්වීමේ සැලැස්ම පිළිබඳව විස්තරාත්මකව දැනුවත් කිරීම.
- ජීවනෝපාය සංවර්ධන උපාය මාර්ග හඳුනාගැනීම හා සැලසුම් සකස් කිරීම.
- මානසික සංවර්ධන උපාය මාර්ග.
- සාමාජීය සංවර්ධන උපාය මාර්ග.
- කුසලතා සංවර්ධන ක්‍රමෝපායන්.
- ව්‍යාපාර සැලසුම් සකස් කිරීම.
- සහනාධාර යැපුම් මානසිකත්වයෙන් මුදවාගැනීමට ප්‍රතිලාභීන් තුළ ව්‍යවසායකත්ව සංවර්ධන කුසලතා ඇති කිරීම සඳහා ආකල්ප සංවර්ධනය කිරීම.
- ග්‍රාමීය හා ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු සම්බන්ධීකරණය.
- සහාය සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය කර ගැනීම.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 28 |

මෙම පුහුණු වැඩසටහන් සඳහා සහනාධාර යැපුම් මානසිකත්වයෙන් මුදවාගෙන ව්‍යවසායකත්ව සංවර්ධනයට යොමු කිරීමට අදාල දේශනයට ඔබ දිස්ත්‍රික්කයේ දැනටමත් මේ සම්බන්ධව පුහුණුව ලත් සමෘද්ධි කළමණාකරුගේ සේවය ලබා ගැනීමට අදාල නිලධාරීන් දැනුවත් කළ යුතුය.

06. වැඩමුළු සඳහා සහභාගීවන නිලධාරීන් සඳහා කෙටි සංග්‍රහයක් ලබා දීමට එක් නිලධාරියෙකුට රු.125/- ක මුදලක් වෙන් කර ඇත. ඔබ දිස්ත්‍රික්කයට වෙන් කළ ප්‍රතිපාදන මුදල් සම්බන්ධ විස්තරය ඇමුණුම 01 සමඟ එවා ඇත. ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවැත්වෙන වැඩමුළුවලට සහභාගී වන නිලධාරීන් ගණනට අනුව ප්‍රතිපාදන මුදල් ලබා දීමට කටයුතු කරන ලෙසත් දන්වමි.

07. පුහුණු වැඩමුළු 2024 නොවැම්බර් 01 වන දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වා අවසන් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලෙසත්, ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ වැඩමුළු පැවැත්වීම සම්බන්ධ විස්තර ඇමුණුම් 02 ට අනුව සකස් කර සැලසුම් අංශයේ dirpm123@gmail.com විද්‍යුත් ලිපිනය හරහා 2024.10.20 දිනට පෙර එවන ලෙසත් දන්වමි.

දී ඇති උපදෙස් අනුව ක්ෂේත්‍ර නිළධාරින්ට පුහුණු වැඩමුළු පවත්වා අවසන් කර, එහි ප්‍රගතියද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලබාගෙන ඇමුණුම-03 අනුව පිළියෙල කර 2024.11.08 දිනට පෙර මෙම විද්‍යුත් ලිපිනයට එවන ලෙසත් දන්වමි.

08. තවද, 2024.06.24 දින ඔබ වෙත එවන ලද චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් පරිදි, සවිබලගැන්වීමට වසම් මට්ටමින් හඳුනා ගත් ප්‍රතිලාභී පවුල් සඳහා පවුල් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාල තොරතුරු රැස් කිරීම, දී ඇති ආකෘතියට අනුව පිළියෙල කිරීම 2024.10.31 දිනට පෙර නිම කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් වැඩි දුරටත් දන්වමි. (ආකෘති පත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන මේ වන විටත් දිස්ත්‍රික්ක වෙත එවා ඇත.)

09. ඉහත කාර්යයන් ඉටු කිරීම සම්බන්ධව යම් ගැටළුවක් ඇත්නම් ඒ බව මා වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලෙස දන්වමි.

10. සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන සම්බන්ධව දැනට දී ඇති උපදෙස් අනුව සවිබලගැන්වීමේ ප්‍රගතිය අමාත්‍යාංශ මට්ටමින් හා රජයේ/ අභ්‍යන්තර විගණන අංශය විසින් නිරතුරුව කරුණු විමසන බැවින්, වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ඔබගේ සහ ප්‍රාදේශීය හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ විශේෂ අවධානයට යොමු කර, අදාල කටයුතු නියමිත දිනයන්ට නිම කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. අතිරේක ලේකම් (සංවර්ධන I)
බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකබද්ධතා,
සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය - කා.දැ.ගැ.ස
2. ප්‍රධාන ගණකාධිකාරී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - ප්‍රතිපාදන නිදහස් කිරීම හා කා.දැ.ගැ.ස
3. අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ හා අ.ක.ස
4. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ හා අ.ක.ස
5. සියලුම සමෘද්ධි බැංකු සමිති කළමණාකරුවන් - කා.දැ.ගැ හා අ.ක.ස
6. සියලුම සමෘද්ධි බැංකු කළමණාකරුවන් - කා.දැ.ගැ හා අ.ක.ස

# අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ක්ෂේත්‍ර නිලධාරින් පුහුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

| අනු අංකය | දිස්ත්‍රික්කය | අයත් ග්‍රාම නිලධාරි වසම් ගණන | එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|---|
| 1 | කොළඹ | 557 | 69,625 |
| 2 | ගම්පහ | 1,177 | 147,125 |
| 3 | කළුතර | 762 | 95,250 |
| 4 | ගාල්ල | 896 | 112,000 |
| 5 | මාතර | 650 | 81,250 |
| 6 | හම්බන්තොට | 576 | 72,000 |
| 7 | මහනුවර | 1,187 | 148,375 |
| 8 | මාතලේ | 545 | 68,125 |
| 9 | නුවරඑළිය | 491 | 61,375 |
| 10 | කෑගල්ල | 573 | 71,625 |
| 11 | රත්නපුර | 575 | 71,875 |
| 12 | කුරුණෑගල | 1,610 | 201,250 |
| 13 | පුත්තලම | 548 | 68,500 |
| 14 | පොළොන්නරුව | 295 | 36,875 |
| 15 | අනුරාධපුර | 694 | 86,750 |
| 16 | බදුල්ල | 567 | 70,875 |
| 17 | මොණරාගල | 319 | 39,875 |
| 18 | අම්පාර | 503 | 62,875 |
| 19 | මඩකලපුව | 346 | 43,250 |
| 20 | ත්‍රිකුණාමලය | 230 | 28,750 |
| 21 | යාපනය | 435 | 54,375 |
| 22 | කිලිනොච්චිය | 95 | 11,875 |
| 23 | මන්නාරම | 153 | 19,125 |
| 24 | වවුනියාව | 102 | 12,750 |
| 25 | මුලතිව් | 136 | 17,000 |
| එකතුව | | **14,022** | **1,752,750** |

ඇමුණුම - 02

<u>සව්බලගැන්වීමේ.ජාතික වැඩසටහන පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.</u>

දිස්ත්‍රික්කය:-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම | වැඩමුළුව පැවැත්වෙන දිනය | සහභාගී වන නිලධාරීන් ගණන | සංග්‍රහ සඳහා අවශ්‍ය මුදල (රු.) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

<u>සකස් කළේ</u>

නම :-

තනතුර :-

අත්සන :-

<u>සහතික කළේ</u>

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ :-

අත්සන :-

දිනය :-

---

ඇමුණුම - 03

<u>සව්බලගැන්වීමේ.ජාතික වැඩසටහන පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම</u>

<u>සම්බන්ධව ප්‍රගතිය ඉදිරිපත් කිරිම</u>

දිස්ත්‍රික්කය:-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම | වැඩමුළුව පවත්වා ඇත/නැත | වැඩමුළුව සඳහා සහභාගී වූ නිලධාරීන් ගණන | සංග්‍රහ කටයුතු සඳහා වැය කරන ලද මුදල (රු.) | වැඩමුළුව නොපැවැත්වූවේ නම් ඊට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

<u>සකස් කළේ</u>

නම :-

තනතුර :-

අත්සන :-

<u>සහතික කළේ</u>

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ :-

අත්සන :-

දිනය :-